# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 37 දරන
# ශ්‍රී ලංකා සිවු චතුරශ්‍ර ශුභාරංචි සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 ඔක්තෝබර් මස 08 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 ඔක්තෝබර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ : ශත 90 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 37 දරන ශ්‍රී ලංකා සිවු චතුරශ්‍ර ශුභාරංචි සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 ඔක්තෝබර් මස 08 වන දින.]

එල්. ඩී.—ඕ. 78/84.

**ශ්‍රී ලංකා සිවු චතුරශ්‍ර ශුභාරංචි සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

ස්වකීය සාමාජිකයන් විසින් එකඟ වනු ලබන රීතිවලට අනුකූලව ස්වකීය සංගමයේ පරමාර්ථ සහ ඒ හා සම්බන්ධ කරුණු ඵලදායී අන්දමින් ක්‍රියාවේ යෙදීම සහ ඒ ගැන කටයුතු කිරීම පිණිස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය අදහන පුද්ගලයන් පිරිසකගෙන් සමන්විත වූ "සිවු චතුරශ්‍ර ශුභාරංචි සභාව" යන නමින් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංගමයක් ශ්‍රී ලංකාවේ පිහිටුවා ගනු ලැබ තිබෙන හෙයින් ද :

එකී සංගමය එය පිහිටුවීමේදී අරමුණු කොට ගත් විවිධ පරමාර්ථ හා කරුණු මේ දක්වා සාර්ථක අන්දමින් ක්‍රියාවේ යොදවමින් එම කටයුතුවල නිරත වී එය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් එම ඉල්ලීම ඉටු කිරීම පොදු යහපතට හේතු වන්නක් වන බැවින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1986 අංක 37 දරන ශ්‍රී ලංකා සිවු චතුරශ්‍ර ශුභාරංචි සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා සිවු චතුරශ්‍ර ශුභාරංචි සභාව සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සාමාජිකයන් වන මෙහි පළමුවන උපලේඛනයේ නම් සඳහන් වන තැනැත්තන් සහ මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයෙන් තෝරා පත් කර ගනු ලැබූ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් ද, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන යම්තාක් තැනැත්තන් ඇතුළුව (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සිවු චතුරශ්‍ර ශුභාරංචි සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන්, "ශ්‍රී ලංකා සිවු චතුරශ්‍ර ශුභාරංචි සභාව" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, මාරු කිරීමේ හා අලුත් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් ඒවා විය යුතු ය :—

(අ) මෙහි දෙවැනි උපලේඛනයෙහි සවිස්තරව දැක්වෙන අමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ ලොස් ඇන්ජල්ස් හි ග්ලේන්ඩේල් බුල්වාඩ් හි අංක 1100 දරන ස්ථානයේ සිවු චතුරශ්‍ර ශුභාරංචි පිළිබඳ ජාත්‍යන්තර දේවස්ථාන සභාව නමින් වර්තමානයේ හැඳින්වෙන (මෙහි මින් මතු "මාතෘ සභාව" යනුවෙන් සඳහන් කරනු

2—ඒ 080542—7,200 (84/11)

ලබන) මාතෘ සභාවේ ආදී කර්තෘවර අයිම් සම්පල් මැක්fපර්සන් විසින් සංගෘහිත "සාමයික ප්‍රකාශනය" (ක්‍රීඩල් ස්ටේට්මන්ට්) නමැති කෘතියෙන් ඉදිරිපත් කරනු ලැබ තිබෙන සිවු චතුරශ්‍ර ශුභාරංචියෙහි අඩංගු ආගමික මූලධර්ම ප්‍රචාරය කිරීම හා ඒ පිළිබඳ අවබෝධය ප්‍රචලිත කිරීම ;

(ආ) මෙම වගන්තියේ (අ) ඡේදයේ නිශ්චිත පරමාර්ථ වැඩි දියුණු කර ගැනීම පිණිස තුඩු දෙන්නා වූද පුණ්‍යාධාර, ආගමික හෝ අධ්‍යාපනික කටයුතු විශේෂ වශයෙන් මෙහෙයවීම සහ—

(i) යෝග්‍ය සංවිධාන පිහිටුවීම, පවත්වාගෙන යාම හා මෙහෙයවීම සහ සංස්ථාවට අදාළව එම සංවිධානවල සාමාජිකයන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම ;

(ii) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පනවනු ලබන රීතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ සහ සියලු විදේශ රටවල ද ශුභාරංචි සභාවේ පණිවුඩය වැඩි දියුණු කරවා ගැනීම පිණිස ශුභාරංචියේ දේවගැතිවරුන්ට බලය දීම හා ධර්ම ප්‍රචාරකයන් පැවිදි කිරීම ;

(iii) විද්‍යාල ශ්‍රේණියේ වූ ද එම ශ්‍රේණියෙන් යම් පහළ ශ්‍රේණියක වූ ද පාඨශාලා පිහිටුවීම, ඒවායේ හිමිකම් දැරීම හා ඒවා පවත්වාගෙන යාම ;

(iv) සාමයික ප්‍රකාශනයෙහි (ක්‍රීඩල් ස්ටේට්මන්ට්) සංගෘහිත මූලධර්මවලට ගැලපෙන පරිද්දෙන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පනවනු ලබන රීතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ සහ සියලු විදේශ රටවල ශුභාරංචිය පැතිරවීමේ කාර්යය වැඩිදියුණු කර ගනු පිණිස ධර්මදූත සේවාවන් පිහිටුවීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම ;

(v) ශ්‍රී ලංකාවේ වෙසෙන සිවු චතුරශ්‍ර ශුභාරංචි අදහන්නන්ගේ එල ප්‍රයෝජන වැඩි දියුණු කොට, පෝෂ්‍ය කොට, ආරක්ෂා කිරීම සහ එවැනි තැනැත්තන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීම ;

(vi) සිවු චතුරශ්‍ර ශුභාරංචි පිළිබඳ අවබෝධය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කොට ප්‍රචාරය කිරීම පිණිස සංස්ථාවේ රීතිවලට යටත්ව දේවස්ථාන සහ ආගමික සංවිධාන පිහිටුවීම ;

(vii) පුණ්‍යාධාර සහ මානව සංවර්ධන කාර්යයන් අරඹා පවත්වාගෙන යාම ;

(viii) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය අධ්‍යයනය කොට පිළිපැදීම තුලින් මිනිස් සංහතියේ අධ්‍යාත්මික ඉදිරි ගමනට අවශ්‍ය යයි හා ගැලපෙන්නේ යයි සැලකිය හැකි සියලුම කටයුතුවල නිරත වීම ;

(ix) මෙහි ලා විශේෂ වශයෙන් දක්වා ඇති අරමුණු කිසිවක් හෝ වැඩි ගණනක් මුදුන්පත් කර ගැනීම හෝ අවශ්‍ය හෝ යෝග්‍ය වන්නා වූ කවර වූ හෝ කාර්යයක් ඉටු කිරීමට අවශ්‍ය යයි සැලකෙන

කවර වූ හෝ සියලු කටයුතු එම කටයුතු හා කාර්ය යන් එකී අරමුණු ඉටු කර ගැනීමේ කාර්යයෙහි දී භාවිතා කිරීමෙහි දී ඒවා කවර වූ හෝ නීති හෝ ප්‍රතිපාදනවලට නොගැලපෙන්නේ නොවේ නම්, සිදු කිරීම.

4. (1) සංස්ථාව ලාභ නොඋපදවන සංවිධානයක් වශයෙන් සංවිධානය කොට පවත්වාගෙන යා යුතු අතර, සංස්ථාවේ ප්‍රයෝජන, ලාභ හෝ ලාභාංශ සම්බන්ධයෙන් වූ කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොහැරිය යුතු ය. *සංස්ථාව ලාභ නොඋපදවන සංවිධානයක් විය යුතු බව.*

(2) සංස්ථාව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, එහි සියලු ණය හා බැරකම් ගෙවීමෙන් පසුව ඉතිරිවන සියලු වත්කම්, ආගමික, පුණ්‍යාධාර හෝ අධ්‍යාපනික කාර්ය සඳහා විශේෂයෙන්ම පිහිටුවනු ලැබූ හෝ සංවිධානය කරනු ලැබූ යම් අරමුදලක හෝ සංවිධානයක සුභ සිද්ධිය සඳහා ම පමණක් යෙදිය යුතු ය.

5. සංස්ථාව ස්වකීය කටයුතුවල කිසියම් කොටසක් වශයෙන් කිසිම ප්‍රචාරක ක්‍රියාවන්හි යෙදීමෙන් හෝ නොඑසේම ව්‍යවස්ථාදායක කටයුතුවලට බලපෑම් ඇති කිරීමෙන් හෝ ප්‍රසිද්ධ තනතුරක් සඳහා තරග වදින කිසියම් අපේක්ෂකයකු වෙනුවෙන් දේශපාලන ව්‍යාපාරවලට සහභාගී වීමෙන් වැළකිය යුතු ය. *සංස්ථාව දේශපාලනය නොකළ යුතු බව.*

6. සංස්ථාව ආගමික වශයෙන් මාතෘ සභාව කෙරෙහි අවනත විය යුතු වන නමුදු, ඊට ස්වාධීනව ක්‍රියා කිරීම සඳහා පූර්ණ නිදහස තිබෙන අතර, සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය එකී මාතෘ සභාවේ ප්‍රකාශිත මූලධර්මවලට හා ප්‍රතිපත්තිවලට පටහැනි නොවන හෝ අනනුකූල නොවන යම් හා සියලු ක්‍රියා හෝ දේවල් කළ යුතු ය. *මාතෘ සභාව කෙරෙහි ආගමික අවනතිය.*

7. (1) සංස්ථාවේ රීති අනුව තෝරා පත් කර ගනු ලබන පස් දෙනෙකුට නොඅඩු හා දොළොස් දෙනෙකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන්නා වූ (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය. *සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය.*

(2) පළමුවන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්, මෙම පනත ආරම්භ වන අවස්ථාවේ දී ධුර දරන්නා වූ ද, මෙහි පළමුවන උපලේඛනයෙහි නිශ්චිතව නම් දක්වා ඇත්තා වූද සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විය යුතු ය.

8. මණ්ඩලයේ යම් රැස්වීමකට ගණපූරණය පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය. *ගණපූරණය.*

9. (1) නිසි දැන්වීමකින් පසුව කවර වූ අවස්ථාවක හෝ පවත්වනු ලබන රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයින් වැඩි දෙනාගේ ඡන්දයෙන් එවැනි රැස්වීමක දී පහත දැක්වෙන කරුණු සඳහා මේ පනතට හෝ වෙනයම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පැනවීමට මණ්ඩලය ක්‍රියා කිරීම නීත්‍යනුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයින් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හා නෙරපීම ;

(ආ) මණ්ඩලයෙහි සහ සංස්ථාවේ විවිධ ප්‍රාදේශීය ස්ථාන වල, කාර්යාලවල, නියෝජිතයන් සහ සේවකයන් ආදීන් ගේ කටයුතු පවත්වාගෙන යාම ;

(ඇ) ව්‍යාපාර ගනුදෙනු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පිළිවෙළ ;

(ඈ) සංස්ථාවේ නිලධරයන් හෝ මණ්ඩලයේ සාමාජිකයන් තේරීම හෝ පත් කිරීම සහ ඔවුන්ගේ නිල කාල සීමාව නිශ්චය කිරීම ;

(ඉ) සංස්ථාව නිසි පරිදි පරිපාලනය කිරීම පිණිස ආනුෂංගික වන්නාවූද, ඒ හා සම්බන්ධ වන්නාවූද වෙනත් එබඳු කාර්යයන්.

(2) සමාන්‍ය රැස්වීමක දී සාදනු ලැබූ සංස්ථාවේ රීති වෙනස් කිරීම, ඒවාට අලුතින් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම.

10. සංස්ථාවේ සියලුම සාමාජිකයන් සියලුම අවස්ථාවන්හි ක්‍රියාවේ යෙදෙන සංස්ථාවේ රීතීන්ට යටත් විය යුතු ය. සාමාජිකයන් සෑම අවස්ථාවලදීම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු බව.

11. කවරවූ හෝ මිලදී ගැනීමකින්, ඇවරීමකින්, පරිත්‍යාගයකින්, මුදල් පිළිබඳ නියෝගනයකින් හෝ වෙනත් ක්‍රමයකින් සංස්ථාව සතු වන කවර වූ හෝ චංචල හෝ නිශ්චල දේපළක් ලබා ගැනීමට හා එය දැරීමට සංස්ථාවට නීතියෙන් හැකියාව හා යෝග්‍යතාව තිබෙන අතර එබඳු සියලු දේපළ තත්කාලයේ ක්‍රියාවේ යෙදෙන රීතීන්ට යටත් ව ඒවා විකිණීමේ, උකස් තැබීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ක්‍රමයකට ඒවා බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව මේ පනතේ අභිමත කාර්යයන් සඳහා සංස්ථාව මගින් ඒවා දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

12. මෙම පනත ක්‍රියාවේ යෙදෙන අවස්ථාවේ පවත්නා සභාව මගින් ගෙවිය යුතුව ඇති සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව මගින් ගෙවනු ලැබිය යුතු වන අතර, සභාව වෙත ගෙවිය යුතුව ඇති සියලුම ණය සහ දායක මුදල් හා පරිත්‍යාග ආදියද මෙම පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය. සංස්ථාවට ලැබිය යුතු හා එය ගෙවිය යුතු ණය.

සංස්ථාවේ පොදු බලතල.

**13.** මෙම පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ අරමුණු හා පරමාර්ථ හෝ ඉන් කවර එකක් හෝ වර්ධනය කොට ව්‍යාප්ත කිරීම පිණිස අවශ්‍ය හෝ උචිත වන්නාවූ සියලුම ක්‍රියාවන්, කරුණු සහ දේපළ කුමක් වුවද ඉටු කිරීමට, ක්‍රියා කිරීමට හා සම්පූර්ණ කිරීමට සංස්ථාවට බලය තිබෙන අතර මෙයට බැංකු ගිණුම් විවෘත කොට පවත්වාගෙන යාමේ හා වැසීමේ, ඇපකර ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ දීමනා සහ පරිත්‍යාග ලැබීමේ හෝ එකතු කිරීමේ, ස්වකීය අරමුදල් ආයෝජන කිරීමේ, සංස්ථාවේ අරමුණු හා පරමාර්ථ ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය සේවක පිරිස් යොදවා ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලය ද ඇතුළත් වන්නේ ය.

සංස්ථාවට කාර්යාලයක් තිබිය යුතු බව.

**14.** සංස්ථාවට ඊට අයත් කාර්යාලයක් තිබිය යුතු වන අතර, සංස්ථාවේ පොදු මුද්‍රාව මණ්ඩලයේ සභාපතිවරයාගේ භාරය යටතේ තිබිය යුතු ය. සභාපතිවරයා සහ භාණ්ඩාගාරිකවරයා හෝ මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු හෝ පැමිණ සිටි බව සනාථ කිරීම පිණිස කිසියම් සාධන පත්‍රයක හෝ ලියවිල්ලක අත්සන් තබා ඔවුන් සිටින අවස්ථාවක හැර මෙම පොදු මුද්‍රාව කිසිම සාධන පත්‍රයක හෝ ලියවිල්ලක නොතැබිය යුතු ය. එසේ අත්සන් තැබීම සාක්ෂිකරුවකු වශයෙන් වෙනත් කවරෙකු හෝ තබන අත්සනින් නිදහස් ය.

ජනරජයේ අයිතිවාසිකම් සහ වෙනත් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝ අන් කිසි රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාගත ආයතනයක හෝ අන් කිසි වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ ඇති නොවිය යුතු ය.

### පළමුවෙනි උපලේඛනය

(1) ලෙස්ලි ඩබ්ලිව්. කීගල් පූජකතුමා, (සභාපති),
381/1, හයිලෙවල් පාර, නුගේගොඩ.

(2) ඇස්. ජී. නිරන්ජන් දේවගැතිතුමා, (උප සභාපති),
381/1, හයිලෙවල් පාර, නුගේගොඩ.

(3) ඩී. ඒ. ජී. මැන්ඩිස් දේවගැතිතුමා, (භාණ්ඩාගාරික),
28/16, වීර පුරන් අප්පු මාවත, මොරටුව.

(4) ඩේල් එම්. ජයසූරිය දේවගැතිතුමා, (ලේකම්),
හැවන් පැලැස්ස, නිකවැරටිය.

(5) ජී. ජේසුරාසා දේවගැතිතුමා, (සාමාජික),
82/3, දම්රියපොල පාර, හපුතලේ.

(6) ජී. රජමාණි දේවගැතිතුමා, (සාමාජික),
44, ජාවා පටුමග, කොළඹ 2.

## දෙවැනි උපලේඛනය

### අසිම් සෙම්ප්ලේ මැක්ෆර්සන් විසින් සංශෝධිත

### 'සාමයික ප්‍රකාශනය'

1. මුල් ලියවිලිවල වාචික සත්‍යතාව ද,
2. සදාකාලික වූ මහෝත්තම දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ ත්‍රිත්වය ද,
3. අපගේ ස්වාමින් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වය ද,
4. ශුද්ධාත්මයාණන් වහන්සේගේ පෞද්ගලිකත්වය හා දේවත්වය ද,
5. යක්ෂයාගේ සැබෑ තත්ත්වය හා ගති ගුණද,
6. මානව වර්ගයාගේ සහජ පව්ටු හැඟීම් ද,
7. හිලව්වක් වශයෙන් වන්දි ගෙවා වරදින් නිදහස් වීමද,
8. ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් පමණක් පාපය සඳහා අනුග්‍රහ ලැබීමට දරන ප්‍රයත්නය ද,
9. වැඩ කිරීම නොව විශ්වාසය තුළින් වරප්‍රසාදය මාර්ගයෙන් සම්පූර්ණ ගැලවීම ඉදුන්පත් කර ගැනීම ද,
10. වන්දි ගෙවා වරදින් නිදහස් වීම මගින් ලබන දිව්‍යමය ශාන්තියද,
11. රෝගයෙන් පෙළෙන්නවුන්ට තෙල් ආලේප කොට ඔවුන් උදෙසා යාඥා කිරීම ද,
12. අපෝස්තුලුවරුන් විසින් ලබන ලද පරිදි ශුද්ධාත්මයාණන්ගේ පෞද්ගලික බෞතීස්මයද,
13. නව ජන්මයේ අවශ්‍යතාවද,
14. ගණන් ගත හැකි වයසක දී දියෙහි එබීමෙන් ලබන බෞතීස්මයද,
15. ශ්‍රී රුධිරයෙන් සේදුණු සියලු අදහන්නන්ගෙන් සැදුණු එකම සැබෑ සභාවද,
16. මිථ්‍යා දෘෂ්ටිකයන්ට සහ ලෝකයේ ජාතීන්ට ශුභාරංචිය අවබෝධ කොට දීමද,
17. පොදු වන්දනා කටයුතුවලදී අන්ත උමතු බව සහ අති සූජවිධිය අතර මධ්‍යම ප්‍රතිපදාවද,
18. මහජන පාලනයට අවනත වීමද,
19. අලුත් තෙස්තමේන්තුවේ ලියවිලිවල සඳහන් හේතූන් මත පමණක් දික්කසාද වීමද,
20. සභා පාලනයේදී ස්වාමීන් තුළ අපට ඉහළින් අධිකාරවර ලැබ සිටින අයට පක්ෂපාතකම සහ අවනත බවද,
21. දෙවියන් වහන්සේගේ මූල්‍ය සැලැස්ම හැටියට සභාවට ආධාර කිරීමද,
22. හැකි සෑම අවස්ථාවකම අතීතයේ කළ වැරදි සඳහා වන්දි ගෙවීමද,
23. ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනයේදී විවෘත මේසයද,
24. ප්‍රතිපත්ති කැඩීමට, ධර්මය හැර යාමට සහ නැති වීමට පිළිවන්කම ඇති මිනිසාගේ නිදහස් අධ්‍යාත්මික අධිෂ්ඨාන ශක්තියද,
25. යහපත් වැඩ හා ශුද්ධවූ ජීවිතය පවත්වාගෙන යාමද,
26. බයිබලය හැදෑරීම සහ නිරන්තරව යාඥා පැවැත්වීම මගින් පාපය, ආත්මය සහ අයහපත් පුරුදු අභිබවා ලබන ජයග්‍රාහී ජීවිතයද,

27. නියත යටත් වීම සහ කැපවීම තුළින් ලබන ක්‍රිස්තියානි පරිපූර්ණත්වය සහ පාරිශුද්ධියද,

28. ඇඳුම්, පැළඳුම් සහ ආභරණ ආදියේ දී දක්වන ක්‍රිස්තියානි නිහතමානීත්වයද,

29. ස්වාමීන් වහන්සේගේ දිනය නීතියක් හැටියට නොව වරප්‍රසාදමය කරුණක් වශයෙන් වෙන් කොට තබා ගැනීම ද,

30. විනෝද ක්‍රීඩා සම්බන්ධයෙන් හෘදය සාක්ෂියේ නිදහස සහ ලෝකයාට දිව්‍යමය ආදර්ශයද,

31. ආත්මයේ අමරණීයත්වය හා සවිඥානක පැවැත්මද,

32. සාධාරණ හා අසාධාරණ අපේ සැබෑ සිරුරුවල පුනරුත්ථාපනයද,

33. සියලු සැබෑ ඇදහිලිකරුවන් උදෙසා සදාකාලික වන සැබෑ දෙව්ලොව හා ජීවිතයද,

34. හික්මවිය නොහැකි පාපිෂ්ඨයාට ලැබෙන අවසාන නඩු තීන්දුවද,

35. පසුතැවිලි නොවන්නාට ලැබෙන සදාකාලික දඬුවමද,

36. ස්වකීය වූ සියලු සාන්තුවරයන් සමග ක්‍රිස්තුස් වහන්සේ පෞද්ගලිකව හා සැබැවින්ම අවුරුදු 1,000 ක් මිහිතලය පාලනය කිරීමද,

37. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පෞද්ගලිකව හා සැබැවින්ම සහශ්‍රවාර ගණනක් ශාරීරික වශයෙන් පහළ වීමද,

38. අවසානයේදී සාන්තුවරයන්ට උන්වහන්සේ ලා කළාවූද නොකළාවූද, ක්‍රියාවන් සඳහා ප්‍රතිවිපාක ලබා දෙන ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චයාසනයද,

39. කිතුනු සමයේ සියලුම නිකායයන් කිතුනුවන් ලෙසින් ඉවසනු ලැබීමද,

40. අත්‍යාවශ්‍යතාවන් හිදී—සමගිය ; අනවශ්‍යතාවන් හිදී—නිදහස ; සියලු දෙයෙහිදී—පුණ්‍යකර්මය

අපි විශ්වාස කරන්නෙමු.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.